# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2035/19 – 2017 සැප්තැම්බර් මස 06 වැනි බදාදා – 2017.09.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත 15(1) වගන්තිය යටතේ නියමය**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 15 (1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව මහරගම නගර සභාව වෙත පැවරී ඇති ඉඩමක් වශයෙන් මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් වඩා පූර්ණ ලෙස විස්තර කර ඇති ඉඩම අද දින සිට ක්‍රියාත්මකවන පරිදි නාගරික සංවර්ධන අධිකාරිය වෙත මෙම නියෝගය මගින් සතු කරමි.

**පාඨලී චම්පික රණවක (පා.ම.)**
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 අගෝස්තු මස 29 වැනි දින,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 හා 18 මහල,
''සුහුරුපාය'',
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාව තුළ කොට්ටාව ගමේ පිහිටි වලව්ව වත්ත නැමැති උතුරට: හයිලෙවල් පාර සහ මු.පි.ඒ. 3380හි කැබලි අංක 2 ද, නැගෙනහිරට: එම්.වී. විලියම් සහ තවත් අය හිමිකම් කියන ගලබොඩවත්ත ඉඩම ද, දකුණට: මු.පි.ඒ.3380 හි කැබලි අංක 2 සහ බටහිරට: මු.පි.ඒ. 3380 හි කැබලි අංක 2 ට ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම හයක් (13.6) ක් වූ මිනුම්පති විසින් පිළියෙල කරන ලද අංක මු.පි.කො. 997 හා 1969.06.19 දිනැති මූලික පිඹුරෙහි කැබලි අංක 1 න් පෙන්නුම් කෙරෙන ඉඩම් කොටස.

09-492


1A – G 26203 – 27(09/2017) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*